# Secret Mission

## රහස් මෙහෙයුම



Oshini Mahawithana

# Secret Mission

# (රහස් මෙහෙයුම)

ඔෂිනි මන්දාකිණි මහවිතාන

කෘතිය : Secret Mission
(රහස් මෙහෙයුම)

කතාගේ වෙනත් කෘති : අරුම පුදුම චාරිකාව
චාලි සහ සාලි
රතු සපත්තු දෙක

කර්තෘ : ඔෂිනි මන්දාකිණි මහවිතාන
9 B
මහමායා බාලිකා විදුහල, මහනුවර

ලිපිනය : නො.6/1, ජනසවිගම, කුණ්ඩසාලේ

ISBN අංකය : 978-624-208-300-1

කෘතිය පල කරන දිනය : 2025.02.08

මුද්‍රණය :
"PRESS"
නො.24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

පොත් ලිවීමට නිරන්තරයෙන්

උනන්දු කරවන

සෙනවිරත්න ගුරුතුමනි

ඔබටයි මේ පිදුම !

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතා කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


Chic Chat Chick හැඳින්වීම

මූලස්ථානය

Silver Lake අභිරහස

Town Library

පොත් පිටකවරේ

Silver Lake බැම්ම

අභිරහස් ගුහාව

අභිරහස් කුටිය

සැලසුමේ අවසානය

Silver Lake ඉතිහාසය

වීර වික්‍රමය

# Chic Chat Chick හැඳින්වීම

**මේ කතාවේ ඉන්නවා අවුරුදු 14 ක් වුණු ළමයි 7 දෙනෙක්. මේ 7 දෙනා කව්ද කිව්වොත් මේ පාසලේ ඉන්න සුපිරි ළමයි ටිකක්. එයාලා තමයි,**

- Luna Smith
- Zara Roberts
- Olive Cooper
- Mark Johnson
- Ryan Wood
- James Lewis
- Adem Edwads

**මේ හත් දෙනාම යන්නේ නගරෙන් ගොඩක් ඈතට තියෙන** Silver Lake Academy **එකට. ඉතින් මේ හැමෝම 9 පන්තියේ ඉගෙන ගන්න ළමයි. මේ 7 දෙනා ටිකක් වෙනස් ළමයි ටිකක් එයාලාව හැමෝම හඳුන්වන්නේ** Chic Chat Chicks **කියලා.**

"**සුභ උදෑසනක් ළමයි**" Miss margot **පන්තියට එන ගමන් හැමෝටම කිව්වා.** Margot Rosewood **කියන්නේ** chic chat chicks **ලාගේ** class teacher. "**සුභ උදෑසනක් මැඩම්" හැමෝම කිව්වා.**

**"අපිට අද කතා කරන්න තියෙන්නේ ඉතිහාසය ගැන"**

**"අයියෝ " ළමයි කෙඳිරිගෑවා.**

**අපි දෙවන ලෝකයුද්ධය ගැන කිව්වොත් එක තිබුණේ 1939 වන වර්ෂයේ මැඩම් කතාව කියව ගෙන ගියා.**

Ryan **ජනේලයෙන් එලියේ තිබෙන විශාල වැව දෙස බලා සිටියා.**

"Ryan" **මැඩම් කතාකරා.**

**"2 වන ලෝක යුද්දේ පටන් ගත්ත වර්ෂය"**

**"ආ... හ්... හ්..."**

Luna **පිටුපස ඉදන් 1939 කියලා කෙදිරුවා.**

"**1939 දී**" Ryan **උත්තර දුන්නා.**

"හ්ම්"

ඉතින් සාමාන්‍ය විදිහට එදා දවසත් ගෙවුණා. මේ chic chat chicks හැමදාම ඉස්කෝලේ ඉවර වෙලා එයාලාගේ Oak ගසේ හදලා තිබුණු Tree house එකට යනවා. ඒක එයාලාගේ මූලස්ථානය කියලා තමයි තියෙන්නේ. මේ හැමෝම ඇවිත් එයාලාගේ සුපුරුදු වැඩ ටික කරන්න පටන් ගත්තා. Luna එයාගේ පොත් කියවන්න ගත්තා.

Zara එයාගේ ආසම වැඩේ crafting කරන්න පටන් ගත්තා. Olive ට අනිත් අයට නැති විශේෂ හැකියාවක් තිබුණා. ඒ තමයි එයාට සත්තු කියන දේවල් තේරෙන එක. ඉතින් එයා Oak ගසේ ඒ ඉන්න Robin කුරුල්ලෝ දිහා බලන් හිටියා. Mark ගේ ආසම දේ Maths සහ රොබෝ තාක්ෂණය එයා Maths වලින් ගොඩක් දක්ෂයි. Adem කියන්නේ අත්භූත දේවල් ගැන හොයන්න සහ ඒවා විසඳන්න කැමති කෙනෙක්. ඉතින් Mark සහ Adem දෙන්නම පොතක තිබුණු ගණිත ප්‍රහේලිකාවක් විසඳන්න පටන් ගත්තා. James කියන්නේ කලාකරුවෙක්. එයාට සිංදු කියන්න, ලියන්න, වාදනය කරන්න හොඳට පුළුවන්.

Ryan කියන්නේ ගොඩක් sports වලට දක්ෂ කෙනෙක්. එයා Rugby, Football, Cricket, Swimming ඒ වගේ ගොඩක් sports වලට දක්ෂ කෙනෙක්. ඉතින් එයා ඒ වගේම Video games වලටත් දක්ෂයි. එයා හැමදාම වගේ Tree house එකට ඇවිත් Video games play කරනවා. මේ 7 දෙනා හරිම එකමුතුව තමන් වැඩ කර ගෙන ඉන්නවා.



# මූලස්ථානය

මේ Tree house එක එයාලා පොඩි කාලේ ඉඳලම තිබුණු Tree house එකක්. එයාලට ගොඩක් මතක ඒ Tree house එකත් එක්ක තිබුණා.

ඒ Tree house එක පොඩි ඉනිමගකින් නගින්න තියෙනවා. පස්සේ ජනේලයක් තිබුණා. මේ Tree house එකට දොරක් තිබුණත් ඒක තිබුණේ ඉනිමඟ ළඟ නෙමේ. ඉතින් හැමෝම එන්න ඕනේ ඒ ජනේලයෙන් පැනලා Tree house එක ඇතුලේ Zara කරපු ලස්සන crafting පිරිලා ජනේලය උඩ creystl ගල් වලින් හදලා තිබුණු dream catcher එක නිසා ඇතුලේ ලස්සන දිලිසුණා. ඉතින් දකුණු පැත්තේ කෙලවරේ ලොකු මේසයක් තිබුණා. වම් පැත්තේ කෙලවරේ තමා මේ හැමෝගේම දේවල් තියන්නේ, Zara ගේ crafting කරන්න ගන්න බඩු, Ryan ගේ sports බඩු, Luna ගෙයි, Adem ගෙයි, Mark ගෙයි පොත් ලොකු කාබඩ් එකක ඒ ටික ලස්සනට හදලා තිබුණා.

අනෙක් දකුණු කෙලවරේ Balceni දොරක් තිබුණා. ඒ Balceni එකේ තමා Luna පොත් කියවන්නේ සහ Olive සත්තුන්ට කතා කරන්නේ.

අනෙක් හැමතැනම එයාලාගේ ලස්සන crafting සහ photo වලින් පිරිලා තිබුණා. James සිංදු ලියන්නේ ජනේලය ගාව ඉඳලා.

ඉතින් මේ Tree house එක තිබුණේ ඉස්කෝලේ ඉඳලා සැතපුම් 2 ක් විතර ඈතින් Tree house එක එලියේ Zara කරපු ලස්සන painting සහ හදලා තිබුණු ගස් තිබුණා. Painting එක Tree house එකේ බිත්ති කැපිලා පෙනුණා.


nui

# Silver Lake අභිරහස

"හුරේ" කියලා Ryan සහ Mark කෑගැසුවා.

"ඇයි මොකද උනේ " Olive මිමිනුවා.

"අපි අපේ ප්‍රහේලිකාව විසඳුවා."

"ෂා.... මරුනේ ඔයාලා හරි දක්ෂයි නේ" Zara පුදුමෙන් කිව්වා.

"හරි හරි දැන් හැමෝම අහගන්න" කියමින් Ryan video game එක නැවැත්වුවා. හැමෝම අහගෙන හිටියා. "මේ අහන්න ඔයාලා දන්නවනේ මම ගිය සතියේ hockey game එකකට ගියා කියලා. එතකොට මට හිතුණා ඇයි ඒ game එකේ නම Silver lake under water compition කියලා දාලා තියෙන්නේ ඇයි කියලා. මම ටිකක් ඒක ගැන හිතුවා Adem ඔයා මොකද්ද ඒ ගැන හිතන්නේ"

"හ්ම් ඔයා කියන එකත් ඇත්ත. ඕක hockey වලට විතරක් නෙමේ හැම game compition එකකම තියනවා."

"ඔව් ඔය නම ඉස්කෝලේ පටන් ගත්ත  දවසේ ඉඳන්ම තිබුණු නමක්" Luna කිව්වා.

"ඔයාලා දන්නේ නැද්ද silver lake එක යට පොතක් හැංගිලා තියනවලු. ඒක silver lake academy හදපු කෙනාගේ දින පොතලු. එක එයා ආරක්ෂා කරන්න තමයි ලු එතන තියලා තියෙන්නේ, මොකද ඒක නැති වෙයි කියලා. ඒක තිබුණොත් silver lake academy එක හදපු විදිහ හොයාගන්න පුළුවන් ලු....." James කිව්වා.

"කොහෙන්ද ඔයා ඕවා හොයාගත්තේ James Mark ඇහුවා."

"මම music class එකේ ඉන්න කොට පොතක Book under water කියලා සිංදුවක් තිබුණා. ඒක මට තේරෙන්නේ නැති නිසා willam sir ගෙන් මේ ගැන ඇහුවා. එතකොට තමා මාත් දැනගත්තේ"

"ඔයාලාට හිතෙන්නේ නැද්ද මේ ඇත්තක් කියලා" Adems කිව්වා.

"ඔයාලාට හිතෙන්නේ නැද්ද මේ ඇත්තක් කියලා" Adems කිව්වා.

"හිතෙනවා" Zara කිව්වා. "ඒත් කොහොමද වතුර යට පොතක් තියෙන්නේ අනික කොහොමද අපි මේක හොයාගන්නේ"

"මේකට ඇයි sports සම්බන්ධ" Ryan ඇහුවා.

"ඒක නිකන් දාපු එකක් වෙන්න ඇති" Olive කිව්වා.

"අපිට මේක ගැන දැනගන්න හොඳම දේ තමා Town එකේ library එක. දන්නවනේ එකේ ගොඩක් පරණ පොත් තියෙනවා කියලා." James කෙදිරුවා.

# Town Library

"හ්ම් ඔව් ඇත්ත" Luna එකඟ වුණා.

"හෙට එහෙම නම් අපි library එකට යමු නේද?" Mark කිව්වා.

ඉතින් හැමෝම එදා නිවාඩු සති අන්තයක් නිසා Tree house එකට එන්න තීරණය කලා. උදෙන්ම Luna සහ Mark ආවා.

"Good Morning Luna උදෙන්ම ආවාද?" Mark ඇසුවා.

"Good Morning Mark, ඔව් දන්නවානේ ඉතින් මම වෙලාවට වැඩකරනවා කියලා."

"හ්ම්" Mark එහෙම කියලා හිනා වුණා.

ඊට පස්සේ James, Olive, Zara ආවා.

"Good Morning හැමෝටම" James කිව්වා.

විනාඩි 30 කට පසුව......

තාම Adem ආවෙත් නෑ, Ryan තාම ආවෙත් නෑ, Olive, Balceni එකෙන් පාර දිහා බලාගෙන කිව්වා.

"Good Morning Olive" Adem පාරේ ඉඳලා කෑ ගහලා කිව්වා.

"Good Morning" Ryan සහ Adem දෙන්නම ඇතුලට ආවා.

"මොකද උනේ Ryan" James කෙඳිරුවා.

"Adem ගෙන් ම අහගන්නකෝ"

"ඇයි පරක්කු" Zara මිමිනුවා.

"Ryan උදේ නැගිට්ටේ නෑ. මම මෙයත් එක්ක Tree house එකට එන්න හිටියේ ඒත් මම මෙයාගේ ගෙදර යන කොටත් මෙයා හොඳටම නිදි. මං මෙයාව නැගිට්ටන්නම පැයක් ගියා. ඒකයි පරක්කු වුණේ."

Ryan ට කපටි හිනාවක් ආවා.

"හරි හරි දැන් අපි යමු නේද?" Luna ඇහුවා.

"හ්ම්"

ඉතින් මේ හැමෝම තමන්ගේ foot bicycle අරගෙන Town එකේ Library එකට යන්න ලෑස්ති වුණා ඉතින් සැතපුම් 7 ක් විතර දුරින් තමා මේක තිබුණේ. ඉතින් හැමෝම ටික දුරක් ගියාට පස්සේ ටිකක් නතර වෙලා හිටියා. (සැතපුම් 7 ක් තියෙන්නේ 10.5km වගේ)

Mark, Ryan එක්ක ගමනක් ගිහින් එන්නම් කියලා කියා ටික වෙලාවකින් cherry buscket එකක් අරගෙන ආවා.

"Wow, මං cherry කන්න ගොඩක් ආසයි" Luna ආසාවෙන් කිව්වා.

හැමෝම cherry කාලා ආයෙත් යන්න පටන් ගත්තා.

Town library එකට කොහොම හරි 11.00 ට වගේ ආවේ.


"හරි එහෙනම් අපි අපේ වැඩේ පටන් ගමු" Adem මිමිනුවා.

"හ්ම් අපි පරණ පොත් තියන තැන් වලට යමු" James අදහසක් දුන්නා.

හැමෝම silver lake එක ගැන හොයන්න හරි ආසාවෙන් හිටියේ. හැමෝම දූවිලි වලින් පිරුණු පොත් අරගෙන හොයන්න පටන් ගත්තා.

Olive එක පොතක් අරගෙන කියවන්න ගන්න කොට ඒ පොතේ පිටකවරේ ලස්සන නිසා හැමෝටම පෙන්නුවා.

හැමෝම ඒ පොත දිහා බලන්න ගත්තා.


MISERY
YORK
CATS
U.F.O.
CHAVS
BIG
GUITAR
NEIGHBOURS FROM HELL
CHE
BITS + BOBS
BRICK A BRACK
KNICK KNACKS
CRYSTAL HEALING
ODD'S + SOD'S

# පොතේ පිටකවරේ

"Wow, ලස්සන Art එකක්" Ryan, Olive ට මිමිනුවා.

"ඒක Art එකක් නෙමෙයි, එක ගුහාවක crafting එකක්. මේක හදලා තියෙන්නේ ඇත්ත ගල් වලින් ඒ වගේම මේ කොළ හදලා තියෙන්නේ විශේෂ හම් වර්ගයකින්" Zara ඒක දිහා උවමනාවෙන් බලමින් කිව්වා.

"ඔව් ඔය පොත ප්‍රහෙලිකාවක්" Adem රහසින් කිව්වා.

"අපි මේ පොත tree house එකට අරන් ගිහින් කියවමු, මෙතන ගොඩක් අය බලන් ඉන්නවා" Mark වටපිට බලමින් කිව්වා.

හැමෝම එන අතර මඟ ලොකු කල්පනාවක ආවේ.

"Adem හිතන්නේ නැද්ද ඔය පොත අපිට මොනා හරි කියනවා කියලා" Olive කිව්වා.

"ඔව් මේ අපි හොයන පොත ගුහාවක් ඇතුලක තියෙන්නේ, ඒකයි මේ පිටකවරේ මේ වගේ හදලා තියෙන්නේ" Adem බයිසිකලය වේගයෙන් පදමින් කෑගැහුවා.

හැමෝම tree house එකට ආවා.

"මේ අහන්න අපේ අම්මා අපිට කන්න sandwitches හදලා දුන්නා" James කෙඳිරුවා.

"අනේ මං ඔයාගේ අම්මා හදන jam එකට හරි ආසයි." Mark Balceni එකේ ඉදන් ඇතුලට එන ගමන් කිව්වා.

Adem sandwitche එක කන ගමන් library එකේ පොත ගැන කල්පනා කරා.

"ඔයාලා මේ වගේ තැනක් කවදා හරි දැකලා තියෙනවා ද?" Adem ඇහුවා.



# Silver Lake බැම්ම

"මම football practice ගියපු දවසක මගේ අතින් football එක විසි වෙලා ground එකේ අයිනට විසිවුණා. බෝලේ හොයන වෙලාවේ ground එක වටේට තියන බැම්මේ ඔය රටාවට සමාන චිත්‍රයක් තිබුණා. ඒක පැෂන් වැල් වලින් වැහිලා තිබුණේ" Ryan අතේ තිබුණ ඇපල් කමින් කිව්වා.

පස්සේ හැමෝම හෙට මේ කරන්න යන දේ ගැන කතා වුණා.

"හරි අපි එහෙනම් කතා වෙමු කොහොමද මේක කරන්නේ කියලා" Luna පොත දිහා බලාගෙන මිමිනුවා."

හරි මෙහෙමයි plan එක, Mark කියන්න පටන් ගත්තා. ඔයාලා Ryan, Adem, James, Zara ඔයාලා මේ වැඩේට යන්න ඕනේ. Luna, Olive මම අපි tree house එකේ ඉඳන් ඔයාලට messages දෙනවා. James ඔයාට තියෙන්නේ වැදගත් දෙයක් අපේ ඉස්කෝලේ seceury guide ගේ room එක ළඟ හැංගිලා අපිට messages දෙන එක මොකද, අපිට එතන අපිට camera එකක් නැති නිසා"

"හරි, මං ඒ වැඩේ කරන්නම්"

හැබැයි පරිස්සමින්, Mark කියාගෙන යන්න පටන් ගත්තා. Luna සහ මම අපි ඔයාලට අපි සවි කරලා තියන cameras වලින්නුයි. අපි plan කරන්න ඉන්න දේවලුයි කියනවා. ඒ වගේම olive ඔයා james මොනහරි කියනවද කියලා බලන්න.

"Zara, Adem, Ryan ඔයාලට තියෙන්නේ ඒ දොර හොයාගෙන photos ගහලා. අපිට වැදගත් දේවල් තියනවද බලලා පරිස්සම ආයෙත් එන එක"

"මේ ear plugs ගන්න. මේවාගෙන් අපි කියන දේවල් ඔයාලට ඇහෙයි. ඒ වගේම මේ back pack ටිකත්. මේ back pack වල cameras දාලා

තියෙන්නේ. ඒවා අපිට පේනවා. මේ camera එක ගන්න මෙකෙන් ගන්න photos automatically scan වෙනවා.''

''Olive මේක ගන්න James කියන හැමදේම ඔයාට ඇහෙයි'' Mark ඉවර කරා.

''Mark ඔයා ද මේ ඔක්කොම හැදුවේ'' Zara කතාවට එකතු කරා.

ඔව්, Mark සිනා සෙමින් කෙඳිරුවා.

James, Ryan, Adem එන්න මාත් එකක් ගිහින් හෙට ඕනේ කරන බඩු අරං එමු. Mark කිව්වා.

''Boys ලා ටික ගිය නිසා අපි මේ පොත පොඩ්ඩක් බලමු, Olive මිමිනුවා.''

හා, Zara හා Luna එක්කරා.

Boys ලා ටික ආවා. එයාලා හැමෝම එකතු වෙලා cameras වල screen set කරා.

''මාව ඇහෙනවාද ඔයාලාට'' Luna ear plugs check කරමින් ඇසුවා.

''ඔව්, ඇහෙනවා'' හැමෝම කිව්වා.

හැමෝම උදේම එන්න කතා වුණා.

පසුදා උදේ (ඉරිදා දිනක්)

හැමෝම උදේම ආවා. ඒත් Ryan හැමෝම ආවට පස්සෙයි ආවේ.

''හරි රහෙනම්, අපි ඊයේ plan කරපු විදිහට කරමු, Good Luck'' Mark ආඩම්බරෙන් කිව්වා.''

හැමෝම තමන්ට යන්න ඕනේ තැන් වලට ගියා.

Ryan, James, Zara සහ Adem ඉස්කෝලේ වැටෙන් හොරෙන් පැනලා ඇතුලු වුණා.

Olive, James ට ''James ඔයා ඔය ගහ ළඟ ඉන්න. එතන ඔයාව guide ට පෙන්නේ නෑ.''

James **නතර වුණා.** Ryan, Zara, Adem, football ground **එකට යන්න ගියා.**

**නවතින්න !** Luna **පණිවිඩය දුන්නා.**

**ඇයි ! !**

**අද** margot madam, **ඇවිත් ඉන්නේ, ඔයාලා දැන්ම ඔතන** class room **එකට යන්න.** Luna **මිමිනුවා.**

**හැමෝම** class room **එකේ හැංගුණා.**

Mark **ලොකු හුස්මක් ඇරියා. "99 න් බේරුණේ, හරි දැන් යන්න, බලාගෙන** CCTV cameras **තියනවා"** Mark **කිව්වා.**

Olive **කෑ ගසා මෙහෙම කිව්වා, "බය වෙන්න එපා** John Uncle **ට නින්ද ගිහින්ලු** James **කිව්වා."**


football court **එකට ඇවිත්** Ryan **කිව්ව බැම්ම ගාවට ගියා. පැෂන් වැල් වලින් වැහිලා තිබුණු බිත්තිය** Ryan **විනාඩියෙන් සුද්ද කරා.**

**"අපි ඇවිත් ඉන්නේ"** Zara **කෙඳිරුවා.**

**"හරි ඔයාලා ඒක පොඩ්ඩක් බලන්න"** Luna **පැවසුවා.**

Adem **එක දිහා බලාගෙන කල්පනා කර කර** Ryan **සහ** Zara photos **ගැහුවා.**

**"පොඩ්ඩක් ඔය පොත දෙන්න"** Adem, Zara **ට කිව්වා.**



# අභිරහස් ගුහාව

Adem, Zara ගෙන් පොත අරගෙන බිත්තියේ මැදින් තද කරා පොත බිත්තියේ මැදින් ඇතුලට ගිහින් හිර වුණා. ටික වෙලාවකින් පොත කැරකිලා දොරක් ඇරුණා.

"Adem ඔයානම් නියමයි" හැමෝම කියන්න ගත්තා.

"ඉන්න යන්න කලින් james එක්ක යන්න" Mark කිව්වා.

Olive, James ට කතා කරා. "ඔයත් යන්න"

Mark හදලා දුන්න විශේෂ Drona එක නිසා ලොකු එලියක් වගේම, Olive, Luna සහ Mark ටත් ඒ හැමදේම බලාගන්න පුළුවන් වුණා. ටික දුරක් යන කොට එන්න කළුවර වුණා. හැමෝම තමන් ගාව තිබුණු touch පත්තු කර ගත්තා.

"මේ බලන්නකෝ මේ පිලිම මේවා ඔක්කොම players ලාගේ පිලිම නේ" James පුදුමෙන් කිව්වා.

"මට නම් දැන් බය හිතෙනවා" Zara වට පිට බලමින් කිව්වා.

"බය වෙන්න එපා Zara, අපි හැමෝම ඉන්නව නේ" කියමින් James, Zara දෙස බලමින් කිව්වා.

"මේ හැමෝම අහගන්න" Luna කියන්න පටන් ගත්තා, Drona එකට පේනවා ඔතන පඩිපෙලක් තියෙනවා අඩි 7 කින් පරිස්සමින් යන්න. නතර වෙන්න ! Mark කෑගැසුවා. පඩිපෙල දිගේ යන්න. එකේ පඩිපෙල් 25ක් තියෙනවා.

මේ හැමෝම පඩිපල දිගේ පහළට ආවා. ආවට පස්සේ එයාලා දැක්කා ලොකු දොරක් තියෙනවා.

"මොකක්ද ඒ" James පිටුපස ඉඳලා කිව්වා.

Adem ඉස්සරහට ඇවිද ගෙන ගියා.

"මේ දොර අරින්නේ කොහොම ද?" Zara, Adem ගේ පිටුපස ඉඳන් ඇහුවා.

Ryan, Adem දෙස බලා මෙහෙම කිව්වා. අපි එතකොට දැක්ක හැමදේම sports වලට සම්බන්ධයි. මේකෙත් එහෙම ඇති.

"ඔව් ඇත්ත Ryan" Luna කතා කරා.

"අපි ඔයාලා එවපු ඒවා scan කරා" Mark කිව්වා.

"ඔයාලට ඔය හරියේ දකින්න තියෙනවද ඉලක්කම් වගයක්" Luna ඇහුවා.

"ඔව් තියෙනවා" Zara පිටුපස බිත්තියේ තිබුණු ඉලක්කම් දෙස බලා පැවසීය.

"අහ් එහෙනම් ඒකේ 459 ගහන්න" Luna කිව්වා.

දොර ඇරෙන්න පටන් ගත්තා.

හැමෝම පුදුමයෙන් ඇතුළට ගියා.

Ryan, Mark ගෙන් මෙහෙම ඇහුවා. "මොකද්ද 459 කියන්නේ"

"459 කියන්නේ Arthur Crawford මහතා ගත්ත ලොකුම ලකුණු ප්‍රමාණයක්."

# අභිරහස් කුටිය

"කවුද එතකොට මේ Arthur Crawford කියන්නේ" Ryan ඇහුවා.

"හිටපු පොහොසත් කෙනෙක් පස්සේ ඔක්කොම කියන්නම් දැන් ඉස්සරහට යන්න" Luna කිව්වා.

"ඔයාලා මෙතන ඉන්න තිබුණේ Adem පුදුමෙන් කිව්වා. මෙතන එක පොතක් නෙමෙයි පොත් ගොඩක් තියෙනවා."

"අපිට පේනවා Adem අපිත් පුදුම වෙලා ඉන්නේ" Mark කිව්වා.

"හරි දැන් අපි මොකද කරන්නේ" Zara ඇහුවා.

"ඔයාලා බලන්න ඔතන තියන එයාගේ diary හොයන්න. ඒක අරගෙන එන්න"

"මෙතන නම් මාරම දූවිලි ගොඩක් තියෙන්නේ" Ryan කිව්වා.

"මම හිතන්නේ මම ඒක හොයාගත්තා" James කිව්වා.

"කෝ බලන්න, ඔව් ඒ මේක තමා අපි යමු එහෙනම්" Adem හැමෝටම කිව්වා.

"Zara, Ryan යමු" Adem, James ළඟ ඉඳලා කිව්වා.

"ඔයාලා පරිස්සමින් එන්න" Mark හැමෝටම කිව්වා.

"ඔයාලා football ground එකේ වැටෙන් පැනලා එතන apple ගහ ගාට ඉන්න. අපි එන්නම්. ඔයාලා එතකන් යන්න. හැමෝම පරිස්සමට ආහ්. ඒ වගේම margot madam ඉස්කෝලේ දැන් නෑ." Luna හැමෝටම කිව්වා.

# සැලසුමේ අවසානය

Olive, Luna සහ Mark එයාලාගේ foot bicycle අරගෙන ගියා. අරගොල්ලොන්ට කියපු විදිහටම එයාලා apple ගහ ගාවට වෙලා හිටියා. හැමෝම තමන්ගේ foot bicycle බෙදාගෙන ආවා. James තමන්ගේ foot bicycle එක ගෙනත් දුන්නා. Mark, Ryan එක්ක ආවා.

Olive ගේ bicycle එක Adem ට දුන්නා. Zara, James එක්ක ආවා. හැමෝම මහන්සි වෙලා කරපු නිසා හැමෝටම සතුටුයි. හැමෝම tree house එකට ආවා. Luna සහ Mark වැඩේ කරන කොට Olive හොරෙන් හැමෝටම කන්න Sandwitches සහ Lime juice හදලා.

"අම්මෝ හොඳටම මහන්සි" Ryan කිව්වා.

"හරි හරි හැමෝම වාඩි වෙන්න" Olive හැමෝටම කිව්වා.

හැමෝම හති අරිමින් වාඩි වුණා. Olive තමන් හදපු කෑම ටික ගෙනවා.

"Wow olive කොයිවෙලේද මේවා හැදුවේ" Luna ඇසුවා.

ඔයාලා අරගොල්ලොන්ට පණිවිඩ දෙන වෙලාවේ තමා හැදුවේ.

"ඔයා නම් සුපිරි olive" Ryan කෑම දෙස බලා කිව්වා.

හැමෝම කන්න ගත්තා. හැමෝම කෑම වර්ණනා කරන්න පටන් ගත්තා.

"හරි Luna ඔයා අපිට ඉතුරු ටික කිව්වේ නෑනේ" James ඇහුවා.

"මොනාද?" Mark ඇහුවා.

"අර Arthur Crawford කියන්නේ කවුද කියලා" Zara පිළිතුරු දුන්නා.

"ආහ්" Luna කියන්න පටන් ගත්තා.

# Silver Lake ඉතිහාසය

"Arthur Crawford කියන්නේ ඉස්සර හිටපු ලොකු පොහොසත් මනුස්සයෙක්. ඉතින් එයාට හිටියා පෙම්වතියක් Elina Walker කියලා ලස්සන ගැහැණු කෙනෙක්. Elina ආසයි ගොඩක් පරිසරයට Elina පරිසරයට ආදරය කරපු කෙනෙක් ඉතින් Arthur ට ඕනේ වුණා Elina ආස කරන විදිහේ ගෙයක් හදන්න. ඉතින් එයා ඒ කියන්නේ Arthur Elina ට ගෙදරක් හදනවා. ඒ තමයි අපේ ඉස්කෝලේ. ඒ වගේම Arthur ක්‍රීඩා වට දක්ෂ වගේම ආදරේ කෙනෙක්. ඉතින් දවසක් Arthur අශ්වයාගේ පිටේ යන තරඟයකට සහභාගී වෙනවා. හැමදාම වගේ පළවෙනියා වෙන Arthur එදා අශ්වයාගේ පිටෙන් වැටිලා දෙවෙනියා වෙනවා. ඒ විතරද එයාට එයාගේ ජීවිතේ ක්‍රීඩාවත් එක්ක තිබ්බ බැඳීමත් නැතිවෙලා යනවා. Arthur ට එයාගේ ක්‍රීඩා ජීවිතේ අවසාන තරඟය රිදී පදක්කමක් ලැබීම. එයාට මාර දුකක් දුන්නා. එයාගේ කකුල් දෙකට සිදුවුණු ඒ සිදුවීම නිසා ඇවිදින්න බැරි වෙනවා. Arthur දුක් විදින දිහා බලන් ඉන්න බැරි නිසා Elina සේවකයන්ට අණ කරනවා පොළොව යට ගුහාවක් හදන්න කියලා. ඒකට වෙනම කාමරයක් හදන්න කියලත් ඊට පස්සේ Arthur තමන්ගේ ජීවිතේ පුරාම රැස් කරපු කුසලාන, ඒ වගේම Arthur ලියපු පොත්, සහතික, පින්තූර ඔක්කෝම ඒ කාමරයට දාන්න කියලා ඒ වගේම ඒ ගුහාව උඩ වැවක් හදන්නත් කියලා. මොකද Arthur ගේ ලෙඩේට අනුව එයා දවසෙන් දවස මිය යන නිසා අවසාන කාලේ Elina ට Arthur එක්ක එකට සතුටින් ඉන්න ඕනේ නිසා, ඒ වගේම Arthur අන්තිමේට ගත්ත රිදී පදක්කම ඒ වැවට විසි කරනවා. ඒකයි silver lake කියන්නේ. Arthur ගේ මතකය නැති වීම නිසා එයා සතුටින් මිය යනවා. Elina අවසාන කාලයේ විදපු දුක ගැන තමා ඒ පොතේ තිබුණේ. ඒ වගේම 459 කියන්නේ Elina,

Arthur ව මුලින්ම දැක්ක දවසේ තරගයේ Arthur ලබා ගත්තු ලකුණු ගාන Arthur මිය ගියාට පස්සේ Elina ඒ කාමරයට හැමදාම ගියාලු. Elina, Arthur ගැන හිතලා දුක් වෙලා මිය ගිහින් ඉතින් මං මේ හැමදේම හොයා ගත්තේ library එකේ පොතෙන් ඒකේ පිටු පිළිවෙලකට තිබුණේ නැහැ." Luna ඉවර කරා.

"Luna ඔයා නම් සුපිරි වැඩ්ඩෙක්" Mark කිව්වා.

Luna සිනාසුනා.

"හෙට අපිට ඉස්කෝලේ අපි මේ ගැන මැඩම් margot ට කියන්න කලින් කියවලා ඉමු."

හැමෝම එකතු වෙලා කියවන්න ගත්තා.

chic chat chicks ලා මේ diary එක කියවන කොට වෙලා ගියා තේරුණේ නෑ. Arthur Crawford මහතාගේ දක්ෂතා දැකලා පුදුම වුණා.



# වීර වික්‍රමය

''මේ අහන්න දැන් හවස 6.00 වෙන්නත් ළඟයි. අපි හැමෝම ගෙදර යමු. අපි කරපු වික්‍රමය ගැන ඉස්කෝලේටම හෙට කියන්න තියනවා.'' Olive කෙඳිරුවා.

''හ්ම් ඇත්ත එහෙනම් යමු'' Ryan කිව්වා.

හැමෝම තමන්ගේ ගෙවල් වලට ගියා.

හැමෝම උදේම ඉස්කොලේ ආවේ. හැමෝම ආසාවෙන් බලාගෙන හිටියේ මැඩම් margot ට කියන්න.

උදේ පන්තියට margot මැඩම් ආවට පස්සේ margot මැඩම් පුදුම වුණා මැඩම් Principle Ken ට කියන ගියා.

Principle Ken මේක ගැන දැනගෙන අවුරුදු ගාණක් හොයපු දේ ලැබුණා කියලා කෞතුකාරයට කතා කරා. මේ දේවල් ගොඩක් වටින නිසා. මේ ඔක්කොම කෞතුකාගාරයට භාර ගත්තා.

මේ කරපු විශාල වටිනා දේ නිසා විදුහල්පති chic chat chicks ලාට විශේෂ පදක්කමක් දුන්නා. ඒ වගේම ලොකු තෑගි මුදලකුත් දුන්නා.

ඉතින් chic chat chicks ලා කරපු මේ වැඩේ නිසා ඉස්කෝලේ ගොඩක් මෙයාලා කවුද කියලා දැනගත්තා. ඒ වගේම මේක හොයාගත්ත නිසා මෙයාලගේ photo එකක් කෞතුකාගාරයේ තියන්න අවස්ථාව ලැබුණා. ඒ නිසා හැමෝම මෙයාලා ගැන දැන ගත්තා.

''අපිත් එහෙනම් වීර වික්‍රමයක් කරා''

# නිමි !

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට අල්බක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්නයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තරබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්.